# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.16 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/448/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. රෝහල් ගත කිරීමෙන් පසු පුද්ගලයෙකු මියයාම - නුවරඑළිය පොලිස් වසම.

2026.03.15 දින උදෑසන නුවරඑළිය පොලිස් වසමේ හාවාඑළිය ප්‍රදේශයේ පුද්ගලයෙකු නුවරඑළිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට නුවරඑළිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 39 ක් වූ හාවාඑළිය, නුවරඑළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මරණකරු උදරයේ ඇති වූ ආබාධයක් හේතුවෙන් රෝහල් ගත කර ඇති බවටත්, 2026.03.14 දින පුද්ගලයෙකුගේ පහරකෑමකට ලක්වී ඇති බවටත් සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෙම මරණකරුට පහරදුන් පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇති අතර මෙය මනුෂ්‍ය ඝාතනයක්ද යන්න සම්බන්ධයෙන් අනාවරණය කරගැනීම සඳහා විමර්ශන සිදු කරමින් පවතී.

නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

## 02. හෙරොයින් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටදෙනියාව පොලිස් ස්ථානය.

2026.03.15 දින රාත්‍රී කොටදෙනියාව පොලිස් වසමේ හපුවලාන ප්‍රදේශයේදී කොටදෙනියාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 225 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 165 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 37 ක් වන හපුවලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටදෙනියාව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් පුද්ගලයෙකු බේරා ගැනීම - දික්වැල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2026.03.15 දින උදෑසන දික්වැල්ල හිරිකැටිය මුහුදු තීරයේ දියනෑමට ගිය පුද්ගලයෙකු දිය වැළකට හසු වී මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි දික්වැල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් සැරයන් 68211 නාලක හා පොලිස් කොස්තාපල් 82127 උදයංග යන නිලධාරීන් විසින් එම පුද්ගලයා බේරාගෙන ඇත.

අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 20 ක් වන වැවුරුකන්නල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**04. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.**

2026.03.15 දින රාත්‍රී කාලයේ ගුවන්තොටුපල පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් හා රේගු මත්ද්‍රව්‍ය පාලන අංශයේ නිලධාරින් විසින් ඒකාබද්ධව සිදු කරන ලද වැටලීමකදී මෙරටට රැගෙන එන ලද කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 632 ක් සමග සැකකරුවෙකුද ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකුද අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 26 හා 27 වයස්වල පසුවන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අහුංගල්ල පොලිස් ස්ථානය.**

2026.03.15 දින අළුයම අහුංගල්ල පොලිස් වසමේ ගමකරන වත්ත ප්‍රදේශයේදී අහුංගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් ග්‍රෑම් 261 මිලිග්‍රෑම් 620 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 22 ක් වන පාතේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අහුංගල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පින්වත්ත පොලිස් ස්ථානය.**

2026.03.15 දින රාත්‍රී පින්වත්ත පොලිස් වසමේ ෆැරඩයිස්වත්ත ප්‍රදේශයේදී පින්වත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 60 (බෝතල් 80) ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 756 (බැරල් 04) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 46 ක් වන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පින්වත්ත පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. විදුලි සැර වැදී පුද්ගලයෙකු ජීවිතක්ෂයට - හොරණ පොලිස් වසම.**

2026.03.15 දින රාත්‍රී හොරණ පොලිස් වසමේ කඳන, අමුණුඇළපිල්ල ප්‍රදේශයේ කුඹුරක පුද්ගලයෙකු විදුලි සැර වැදී මියගොස් ඇති බවට හොරණ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 68 ක් වූ කඳන, හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු අනවසරෙන් අදින ලද විදුලි රැහැනක ගැටී මෙම අනතුර සිදුව ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

හොරණ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **පතලකට යටවී පුද්ගලයෙකු ජීවිතක්ෂයට - හොරණ පොලිස් වසම.**

2026.03.16 දින අළුයම හොරණ පොලිස් වසමේ වගවත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකු පතලකට යටවීමෙන් තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට හොරණ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 68 ක් වූ කඳන, හොරණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු අනවසර පතලක මැණික් ගරමින් සිටියදී එයට යටවීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

හොරණ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09.** **පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇතැයි සැක කරන බුද්ධ ප්‍රතිමාවක් හා මැණික් බවට සැකකරන නිල් පැහැත් ගල් 03 ක් සමඟ සැකකාරියන් 03 දෙනෙකු හා සැකකරුවන් 02 දෙනෙකු අත්අඩංගුවට - දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය.**

2026.03.15 දින සවස දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ සල්පිටිගම සඳුන්පුර මාර්ගයේ සල්පිටිගම ප්‍රදේශයේදී දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත මාර්ගබාධක යොදා ත්‍රීරෝද රථයක් පරීක්ෂා කිරීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇතැයි සැක කරන බුද්ධ ප්‍රතිමාවක් හා මැණික් ගල් බවට සැක කරන නිල් පැහැති ගල් 03 ක් සමඟ සැකකාරියන් තිදෙනෙකු හා සැකකරුවන් දෙදෙනෙකු ත්‍රීරෝද රථයක් ඇතුළු කැණීම් උපකරණ සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 32 හා 62 අතර වයස්වල පසුවන බිබිල හා මිණිපේ ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරියන් අවුරුදු 26, 53 හා 55 වයස්වල පසුවන මහියංගණය හා රිදීමාලියද්ද ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

දෙහිඅත්තකණ්ඩිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10.** **ලොරි රථයක යතුරුපැදියක් ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - ගල්ගමුව පොලිස් වසම.**

2026.03.15 දින අළුයම් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ පාදෙණිය අනුරාධපුර මාර්ගයේ පාලු සියඹලෑව ප්‍රදේශයේදී අනුරාධපුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම මාර්ගය අයිනේ නවතා තිබූ ලොරි රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ මහඉලුප්පල්ලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11.** **වෑන් රථයක් යතුරුපැදියක ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - මාවතගම පොලිස් වසම.**

2026.03.15 දින දහවල් මාවතගම පොලිස් වසමේ 09 කණුව හතරලියද්ද මාර්ගයේ පරගහදෙණිය ප්‍රදේශයේදී 09 කණුව හන්දිය දෙසට ධාවනය වූ වෑන්

රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකාරිය කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 72 ක් වූ පරගහදෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ වෑන් රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. යතුරුපැදියක පදික පුද්ගලයෙකු ගැටී ජීවිතක්ෂයට - අහුංගල්ල පොලිස් වසම.

2026.03.15 දින උදෑසන කාලයේ අහුංගල්ල පොලිස් වසමේ අහුංගල්ල ඌරගහ මාර්ගයේ බෝගහපිටිය ප්‍රදේශයේදී අහුංගල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 57 ක් වූ බෝගහපිටිය, අහුංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ යතුරුපැදියේ පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර අහුංගල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. යතුරුපැදිකරුවෙකු මාර්ගය අසල තිබූ ගසක ගැටී ජීවිතක්ෂයට - ඊච්චලම්පත්තුව පොලිස් වසම.

2026.03.15 දින සවස් කාලයේ ඊච්චලම්පත්තුව පොලිස් වසමේ සාම්පූර් ලංකාපටුන මාර්ගයේ උප්පුරාල් ප්‍රදේශයේදී ලංකාපටුන දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා යතුරුපැදියේ ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකු තෝප්පූර් රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකරු මියගොස් ඇත. තුවාල ලැබූ අනෙක් පුද්ගලයින් දෙදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා මූතූර් රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු අවුරුදු 18 ක් වූ බටහිර තෝප්පූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඊච්චලම්පත්තුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**